සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## කුසලතා කැප්ස්ටෝනය - 2016 ජනවාරි

## (SS2) තොරතුරු තාක්ෂණ කුසලතා

(Information Technology Skills)

2016-02-06
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ ලකුණු වෙන් කිරීම:***

| කොටස | අවශ්‍යතාවය | ලකුණු |
|---|---|---|
| A | සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයීම අනිවාර්ය වේ. | 40 |
| B | ප්‍රශ්න හයෙන් හතරකට පමණක් උත්තර සැපයිය යුතුය. | 60 |
| **මුළු ලකුණු** | | **100** |

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යය යොදා ගනිමින්**, ඔබ වෙත සපයනු ලබන **පොත්වල** උත්තර ලියන්න.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 මයික්‍රොසොෆ්ට් ඇක්සස්හි (Microsoft Access) දී "ස්වයං අංක" (Auto Number) නමැති දත්ත වර්ගය මගින් සිදුකරනු ලබන කාර්යය (function) නිවැරදි ලෙස පැහැදිලි කෙරෙන්නේ පහත සඳහන් වාක්‍යයන් අතුරෙන් කුමන වාක්‍යයෙහි ද?

(1) එය, ක්ෂෙත්‍රයකට (field) ඇතුලත් කරනු ලබන පාඨ (text) දත්ත ස්වයංක්‍රියව සංඛ්‍යාත්මක (numeric) ලෙස ආකෘතිකරණය (format) කෙරෙන දත්ත වර්ගයකි.

(2) එය, ක්ෂෙත්‍රයක් සඳහා අහඹු අංක (Random Numbers) ජනනය කිරීමට අපට අවශ්‍ය වූ කල යොදා ගනු ලැබේ.

(3) එය, ස්වයංක්‍රියව වැඩිවන සංඛ්‍යාත්මක අගයන් (automatically incrementing numeric counter) අපට අවශ්‍ය වූ කල යොදා ගනු ලැබේ.

(4) එය, ක්ෂෙත්‍රයකට ඇතුලත් කරනු ලබන සංඛ්‍යා ආසන්නතම පූර්ණ සංඛ්‍යාවට වැටයීම පිණිස ආකෘතිකරණය (format) කිරීම සඳහා යොදා ගැනේ.

1.2 පැතුරුම්පතක D1 කෝෂයේ (cell) කිසියම් අගයක් ඇතැයි උපකල්පනය කරන්න. D2 කෝෂය සඳහා, D1 කෝෂයෙහි අගයට වඩා 5% ක් වැඩි අගය අපට අවශ්‍ය වන්නේනම්, D2 කෝෂයෙහි ඇතුලත් කළ යුතු (typed) සූත්‍රය වන්නේ:

(1) =D1*1.05
(2) =D1*1105
(3) =D1*0.95
(4) =D1*95/10

1.3 මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) හි තෙසාරස් අංගයෙහි (thesaurus feature) අරමුණ නිවැරදි ලෙස පැහැදිලි කරන්නේ, පහත සඳහන් වාක්‍ය අතුරෙන්, කුමන වාක්‍යයෙහි ද?

(1) ලියවිල්ලෙහි (document) අක්ෂර වින්‍යාසය පරීක්ෂා (spell check) කිරීමට.
(2) ලියවිල්ලෙහි ඇතුලත් වචන ගණන ගණන් කිරීමට.
(3) තෝරාගත් වචනයට සමාන තේරුම් ඇති වෙනත් වචන යෝජනා (suggest) කිරීමට.
(4) ලියවිල්ල වෙනත් භාෂාවකට පරිවර්තනය කිරීමට.

1.4 "ඉදිරිපත් කරන්නාට (presenter), ඉදිරිපත් කිරීම (presentation) කරන අතරතුර පාඨමය තොරතුරු (textual information) එකතු කිරීමට මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් හි (Microsoft PowerPoint) මෙම අංගය (feature) උපකාරී වන නමුදු, ප්‍රේක්ෂකයන්ට එය නොපෙනේ." මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් හි ඇති පහත සඳහන් කුමන අංගය ඉහත දැක්වෙන විස්තරයට අනුරූපී (corresponds) වේද?

(1) ස්ලයිඩයක ශීර්ෂයකට (header of a slide) පාඨයක් (text) එකතු කිරීම.
(2) ස්ලයිඩයක ඇති පාඨ කොටුවකට (Text Box in a slide) පාඨයක් එකතු කිරීම.
(3) ස්ලයිඩයකට ශ්‍රව්‍ය පටිගතකරණය (Recording Audio with a slide) කිරීම.
(4) ස්ලයිඩයක සටහන් කොටසට (Notes section of a slide) පාඨයක් එකතු කිරීම.

1.5 විද්‍යුත් තැපැලේ ඇමුණුම් (attachments) භාවිතය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය, පහත ප්‍රකාශ අතුරෙන් තෝරන්න:

(1) විද්‍යුත් තැපැලේ ඇමුණුම් සම්බන්ධයෙන්, ගොනුවක ප්‍රමාණයේ සීමාකරණයක් (file size limitations) නොපවතී.
(2) විද්‍යුත් තැපැල හරහා ඇමුණුමක්, ලබන්නන් කිහිප දෙනෙකුට එකම වේලාවක යැවිය හැකිය.
(3) ඇමුණුමක් වශයෙන් විද්‍යුත් තැපැලක ඇතුලත් විය හැක්කේ එක් ගොනුවක් පමණි.
(4) සියලුම විද්‍යුත් තැපැල් සර්වර් (servers) ඔවුන් වෙත එවනු ලබන විද්‍යුත් තැපැල්, වයිරස සඳහා ස්වයංක්‍රීයව පරිලෝකනය (scan) කරනු ලැබේ.

1.6 අළුතෙන් ප්‍රකාශයට පත්වූ පොතක් මිලදී ගැනීම සඳහා ශිෂ්‍යයෙක් අන්තර්ජාල පොත්හලකට (Internet Bookstore) ප්‍රවේශ (access) වීමට ප්‍රයත්න දරමින් සිටී. පොත් සාප්පුවේ වෙබ් පිටු හැඳුනුමේ නම (Uniform Resource Locator - URL) http://www.topbooks.com නම්, එහි ඇතුලත් "http" යන පදයෙන් හඳුන්වනු ලබන්නේ පහත ඒවා අතුරෙන් කුමක් ද?

(1) ජාලයකට සම්බන්ධ පරිගණකයක් හඳුනා ගන්නා අංකය (IP Address).
(2) වෙබ් අඩවි නාමය (Domain Name).
(3) සත්කාරක නාමය (Host Name).
(4) නියමාවලිය (Protocol).

**1.7** මූල්‍ය සේවා සමාගමක ගණකාධිකාරීවරයෙකු ලෙස කටයුතු කරන **සිල්වා** නව වින්ඩෝස් 7 අංකිත බහුශ්‍රැත ඩිස්කයක වෘත්තීය සංස්කරණය (new Windows 7 Professional edition DVD) ඇණවුම් කර තිබේ. මිලදී ගත් එම ඩිස්කයේ කවරයෙහි සංකේත 25 ක් එනම්, XYX4H-34HDR-23DFE-PQ3E2-ED342 ඇතුලත් ආලෝක කදම්බ මගින් මවන ත්‍රිමාන (hologram) ස්ටිකරයක් අලවා තිබුණි. මෙහෙයුම් පද්ධතිය (OS) පරිගණකයට ඇතුලත් කිරීමේදී සංකේත 25 ක් සහිත එම ලේබලය  අවශ්‍ය වන බැවින් එය ආරක්ෂිතව තබා ගන්නා ලෙසට සමාගමේ තොරතුරු තාක්ෂණ විධායක නිලධාරියෙකු විසින් ඔහු වෙත දන්වා තිබුණි. මෙම සංකේත 25 සහිත ලේබලය හඳුනා ගැනීම සඳහා භාවිත කරන නම පහත ඒවා අතුරින් කුමක් ද?

(1) මුරපදය (Password).

(2) පුද්ගලික හඳුනාගැනීමේ අංකය (Personal Identification Number - PIN).

(3) නිෂ්පාදිත යතුර (Product Key).

(4) පරිශීලක හැඳුනුම්පත (User ID).

**1.8** වාණිජමය වශයෙන් දැනට තිබෙන ව්‍යවසාය සම්පත් සැලසුම් මෘදුකාංගයක් (ERP software) සඳහා උදාහරණයක් වන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමන මෘදුකාංගය ද?

(1) SAP.

(2) Adobe Photoshop.

(3) Microsoft Outlook.

(4) IBM Notes.

**1.9** පහත දැක්වෙන්නේ සංවිධානයක් විසින් භාවිතයට ගන්නා තොරතුරු තාක්ෂණ නිෂ්පාදිත සමහරක් ය. ඒවා අතුරෙන්, වාර්ෂික නඩත්තු ගිවිසුමක් මගින් සංවිධානයට වැඩි වශයෙන් ප්‍රතිලාභ ලබා ගත හැක්කේ පහත සඳහන් කුමන ගිවිසුම මගින් ද?

(1) රැහැන් රහිත බ්ලූටූත් යතුරු පුවරුව (A Bluetooth Keyboard).

(2) මිනිත්තුවකට පිටු 55 ක ධාරිතාව ඇති වර්ණ ලේසර් මුද්‍රණ යන්ත්‍රය (Colour Laser printer).

(3) අඟල් 7 ටැබ්ලට් (7 inch tablet).

(4) බාහිර බ්ලූ රේ රයිටර් (An External Blu-ray Writer).

**1.10** පහත සඳහන් ක්‍රියාකාරකම් අතුරෙන්, තොරතුරු තාක්ෂණ ක්‍රම භාවිතයේදී සදාචාරමය ලෙස පිළිගත නොහැකි ක්‍රියාකාරකමක් ලෙස සැළකිය හැක්කේ කුමක් ද?

(1) ඔබේ කළමනාකරුගේ අවසරය ඇතිව, මුරපද මගින් ආරක්ෂිත, කාර්යාල මේසය මත තැබෙන පරිගණකයකට (desktop PC) සම්බන්ධ වීම (Log in).

(2) අළුතෙන් හඳුන්වා දෙන ලද කාර්යාල නියමයන් සහ රෙගුලාසි, කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් සමඟ ඔවුන්ගේ කාර්යාලයීය විද්‍යුත් ලිපිනයන් හරහා හුවමාරු (share) කර ගැනීම.

(3) ඔබේ පුද්ගලික දුරකතනයේ (smartphone) පරිගණක දත්ත වල ආරක්ෂිත පිටපත් (backup) ඔබගේ කාර්යාලයේ මේසය මත තබන පරිගණකයට ගැනීම.

(4) ඔබේ වින්ඩෝස් 7 පරිගණකයට ආරක්ෂණ යාවත්කාලීන කිරීමක් (security update) බාගත (download) කර ගැනීම.

*අංක 1.11 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්න වල හිස්තැන් පිරවීම සඳහා වඩාත්ම සුදුසු වචනය වරහන් තුල දී ඇති වචන අතුරෙන් තෝරන්න. තෝරාගත් වචනය, අදාල ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න:*

**1.11** මිලදී ගැනුම් ඇණවුම් පිළිබඳ දත්ත ඇතුලත් දත්ත පදනමක (database), මිලදී ගැනුම් ඇණවුම් අංකය …………… [යතුරු ක්ෂෙත්‍රය (key field) / මුර පදය (password)] ලෙස භාවිත කිරීම සඳහා හොඳ උදාහරණයකි.

**1.12** මයික්‍රොසොෆ්ට් එක්සෙල් වල තිබෙන NPV …………… [ක්ෂේත්‍රයට (Field) / ශ්‍රිතයට (Function)], ආවර්ත මුදල් ප්‍රවාහ මාලාවක් (series of periodic cash flows) සහ වට්ටම් අනුපාතිකයක් මත පදනම්ව, ආයෝජනයක ශුද්ධ වර්තමාන අගය ගෙන හැර දැක්විය හැකිය.

**1.13** අපගේ විද්‍යුත් තැපැල් ලිපිනය, තැපැල් නාමලේඛනයකින් (mailing list) ඉවත් කිරීමට අවශ්‍ය වූ විට අප විසින් ඉටු කළ යුතු ක්‍රියාව වන්නේ …………… [අවදායක වීමයි (Unsubscribe / පෙරණයයි (Filter)].

**1.14** මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) වලදී, අපට "Ω" වැනි සංකේතයක් ඇතුළු කිරීමට අවශ්‍ය වේ නම්, …………… [පාඨ කොටුව (Text Box / සංකේත (Symbol)] නම් වූ ලේබලය අපට එබිය (click) හැකිය.

**1.15** මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් (Microsoft PowerPoint) ඉදිරිපත් කිරීමක් දිවෙන (running) අතරතුර තාවකාලිකව එය නවතා අඳුරු තිරයක් (black screen) ලබා ගැනීමට අපට අවශ්‍ය වේ නම්, ……………. [B අක්ෂරය (Character B) / එස්කේප් (Esc)] නම් වූ යතුර එබීමෙන් අපට එසේ කළ හැකිය.

*අංක 1.16 සිට 1.20 දක්වා පහත දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය ද, අසත්‍ය** ද යන්න සඳහන් කරන්න. ඔබේ උත්තරය (සත්‍යය හෝ අසත්‍ය යන්න), අදාල ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** මයික්‍රොසොෆ්ට් ඇක්සස් (Microsoft Access) 2010 දත්ත පදනමක, සමාගම් ගිණුම් වලට සම්බන්ධ රහස්‍ය දත්ත ගබඩා කර තැබීමට අපට අවශ්‍ය වූ විට, මුරපදයක් භාවිත කොට එම දත්ත ගබඩාවේ ඇති දත්ත ආරක්ෂා කළ නොහැකිය.

**1.17** අප යතුරු ලිවීම (typing) ආරම්භ කරන විට, දත්ත ඇතුළු කරන කෝෂය (cell) "ක්‍රියාකාරී කෝෂයක් (Active Cell)" ලෙස හැඳින්වෙන අතර, එය ඇඩි මායිමකින් සීමා වී ඇත (bounded by a heavy border).

**1.18** පොතක් වැනි නිෂ්පාදිතයක් අන්තර්ජාලයෙන් මිලදී ගැනිම සඳහා ගෙවීම් කිරීම අවශ්‍ය කරන විට, අප විසින් අපගේ ස්වයංක්‍රිය ටෙලර් මැෂින් කාඩ්පතේ (ATM Card) පුද්ගල හැඳුනුම් අංකය (Personal Identification Number - PIN) ඇත සිටීම අවශ්‍ය වේ.

**1.19** 2015 ජනවාරි සිට 2015 දෙසැම්බර් දක්වා මාසික විකුණුම් ප්‍රමාණ 12 සහිත වගුවක් ඇතුලත් වර්ඩ් ලේඛනයක (word document), වර්ෂය සඳහා මුළු විකුණුම් එකතුව, "=SUM()" සූත්‍රය යතුරු ලිවීමෙන් (typing) ස්වයංක්‍රීයව ගණනය කළ හැකිය.

**1.20** PPT, PPTX, PPS, PPXS යන සියල්ල මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් භාවිත කර සංවර්ධනය කරන ලද ඉදිරිපත් කිරීම් හි වලංගු වැඩිදියුණු කිරීම් (valid extensions) වේ.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

# B කොටස

ප්‍රශ්න හතරකට (04) පමණක් උත්තර සැපයිය යුතුය.

(මුළු ලකුණු 60)

## 02 වන ප්‍රශ්නය

(a) මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට්හි Add-ins මගින් ඉටුවන කාර්යභාරය (purpose) කෙටියෙන් **පැහැදිලි කරන්න.**

(ලකුණු 02)

(b) ඔබ සේවය කරන සමාගම හඳුන්වා දීම සඳහා මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් ඉදිරිපත් කිරීමක් (presentation) ඔබ විසින් නිර්මාණය කර ඇතැයි උපකල්පනය කරන්න.

"Rehearse timings" විකල්පයෙන් ඉටු කෙරෙන කාර්යය සහ ඔබේ ඉදිරිපත් කිරීම නිර්මාණය කිරීමේදී එය භාවිත කිරීම හිතකර වන්නේ මන්දැයි **පැහැදිලි කරන්න.**

(ලකුණු 03)

(c) පවර්පොයින්ට් ඉදිරිපත් කිරීම, සාමාන්‍ය දර්ශන පථය (Normal View), විනිවිදක සංදර්ශන පථය (Slide Show View) සහ සර්පණ පේළිමේ දර්ශන පථය (Slide Sorter View) වැනි විවිධ දර්ශන පථ මගින් අප වෙත ගෙනහැර දක්වනු ලැබේ.

ඉහත දැක්වූ දර්ශන පථ තුන(03) අතර ඇති **වෙනස්කම් හඳුනා දක්වන්න** (differentiate). (ලකුණු 06)

(d) ඔබ සේවය කරන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විකුණුම් වාර්තාවක් ඉදිරිපත් කිරීමට ඔබට සිදුවී ඇතැයි ද, මේ අරමුණ සඳහා මේසය මත තැබෙන ඔබගේ පුද්ගලික පරිගණකයේ (personal desktop computer) මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් ඉදිරිපත් කිරීමක් ඔබ නිර්මාණය කර ඇතැයි ද උපකල්පනය කරන්න. එය USB ඩිස්ක ධාවකයක (USB flash drive) බහා, ඉදිරිපත් කිරීම කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාව වෙත රැගෙන යාමට ඔබ සැලසුම් කර සිටී. එසේ වුවද, ඉදිරිපත් කිරීම සඳහා භාවිත කිරීමට සිතා සිටින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ තිබෙන පරිගණකයේ මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් සවිකර (installed) තිබේදැයි ඔබට නිශ්චිත නැත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ පරිගණකයට මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් සවිකිරීම සඳහා මයික්‍රොසොෆ්ට් ඔෆිස් සවිකිරීම් DVD / මෘදුකාංගය (Microsoft Office Installation DVD / Software) ඔබ සතුව නැතැයි ද එම පරිගණකය ජාලයකට සම්බන්ධ වී නැතැයි ද උපකල්පනය කරන්න.

ඔබේ ඉදිරිපත් කිරීම (presentation) ඉදිරිපත් කිරීම සඳහා යොදාගත හැකි ක්‍රම දෙකක්(02) **පැහැදිලි කරන්න.** ඔබ විසින් කරනු ලබන උපකල්පන කිසිවක් වේනොත් සඳහන් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 15)


## 03 වන ප්‍රශ්නය

(A) මයික්‍රොසොෆ්ට් එක්සෙල් හි දත්ත පෙනෙන්නට (visualize) සැලැස්වීම සඳහා භාවිත කළ හැකි ප්‍රස්තාර වර්ග කිහිපයක් (types of charts) පහත දැක්වෙන රූප සටහන් (images) වලින් පෙන්නුම් කෙරේ. ඒවා එකිනෙක **හඳුනා දක්වන්න:**


(a)




(b)



(c)



(d)



(e)



(ලකුණු 05)

(B) **සීමාසහිත ලයන් ටී (පෞද්ගලික) සමාගම** එහි කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීමට සැලසුම් කරමින් සිටී. පහත දැක්වෙන පැතුරුම්පතෙහි (spreadsheet) එහි සේවකයන්ට අදාල දත්ත ඇතුලත් වේ:

| | A | B | C | D | E | F | G | H | I | J |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | **2015 සේවක කාර්යසාධනය** | | | | | | | | |
| | | | | | | **ප්‍රසාද දීමනාව** | | | | |
| 2 | **සේවක අංකය** | **2015 තුළ වැඩ කළ මුළු පැය ගණන** | **ලබා ගත් නිවාඩු දින ගණන** | **වර්තමාන මූලික වැටුප** | **සේවයේ යෙදී සිටි වර්ෂ ගණන** | **කැපවී වැඩ කිරීම** | **පැමිණීම** | **උප එකතුව** | **ගුණකය** | **මුළු ප්‍රසාද දීමනාව** |
| 3 | E1255 | 1,500 | 5 | 25,000.00 | 4 | 0 | 13,500 | 13,500 | 0.1 | 14,850 |
| 4 | E1258 | 1,900 | 13 | 20,000.00 | 7 | 20,000 | 1,500 | 21,500 | 0.4 | 30,100 |
| 5 | E1251 | 1,680 | 1 | 30,000.00 | 5 | | | | | |
| 6 | E1267 | 1,780 | 10 | 45,000.00 | 10 | | | | | |
| 7 | E1275 | 1,980 | 5 | 28,000.00 | 1 | | | | | |
| 8 | E1280 | 1,890 | 6 | 40,000.00 | 4 | | | | | |
| 9 | E1293 | 1,500 | 8 | 38,000.00 | 3 | | | | | |
| | | | | | | | | | | |

ප්‍රසාද දීමනාව පහත පරිදි ගණනය කරනු ලැබේ:

(i) 2015 වර්ෂය තුළ පැය 1,600 ට වඩා වැඩියෙන් වැඩ කළ සේවකයන්ට, ඔවුන් කැප වී වැඩ කිරීම නිසා දිරි දීමනාවට රු.20,000/- ක් එකතු කර ගෙවනු ලැබේ.

(ii) එක් එක් සේවකයාට වැටුප් සහිත නිවාඩු දින 14 ක් ලබා දී ඇත. ප්‍රසාද දීමනාව ගණනය කිරීමේදී සියලුම ලබා නොගත් වැටුප් සහිත නිවාඩු, දිනකට රු.1,500/- බැගින් ප්‍රතිපූරණය කරනු ලැබේ.

(iii) වර්ෂ තුනකට වඩා සේවයේ යෙදී සිටි සියලුම සේවකයන් වෙනුවෙන්, දිරි දීමනා උප එකතුව, වර්ෂ තුන ඉක්මවන සේවා කාලය සඳහා වර්ෂයකට 0.1 බැගින් වූ ගුණකයකින් (multiplier) එක් එක් අවුරුද්ද සඳහා ගුණ කරනු ලැබේ (දිරි දීමනා ගුණකය).

(iv) එක් සේවකයෙකු සඳහා ගෙවනු ලබන දිරි දීමනා එකතුවහි උපරිමය රු.45,000/- කට සීමා (capped) කරනු ලැබ ඇත.

පැතුරුම්පතක භාවිත කෙරෙන ශ්‍රිතයන් සහ සූත්‍ර පිළිබඳ ඔබේ දැනුම යොදා ගනිමින්, ඉහත පැතුරුම් පත්‍රයේ මතුකර දක්වා ඇති F5, G5, H5, I5 සහ J5 යන කෝෂ සඳහා අදාල සූත්‍ර / ශ්‍රිත **හඳුනා දක්වන්න**.

ප්‍රසාද දීමනා ශිර්ෂය යටතේ ප්‍රදර්ශනය කර ඇති නියැදි අගයන් (sample values) ලබා ගැනීම සඳහා ඉහත දැක්වෙන පේළි (එනම්, 3 සහ 4 පේළි) වලට පිටපත් කිරීමට හැකිවනු පිණිස, මෙම සූත්‍ර / ශ්‍රිත සඳහා අදාල කෝෂ යොමු (cell references) නිවැරදිව දැක්විය යුතුය. (ලකුණු 10)

(මුළු ලකුණු 15)

## **04** වන ප්‍රශ්නය

ඔබගේ මිත්‍රයෙක් නව ව්‍යාපාරික කටයුත්තක් (new venture) ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටී. අන්තර්ජාල පොත් වෙළෙඳසැලක් විවෘත කරනවා ද, නැතහොත් සම්ප්‍රදායිකව භෞතික ලෙස පොත් විකුණන වෙළෙඳ සැලක් විවෘත කරනවා ද යන්න පිළිබඳව ඔහු කල්පනා කරමින් සිටී.

(a) සම්ප්‍රදායක පොත් වෙළෙඳසැලක් ආරම්භ කරනවාට වඩා අන්තර්ජාල පොත් වෙළෙඳසැලක් ආරම්භ කිරීමේ වාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) සම්ප්‍රදායක පොත් වෙළෙඳසැලක් ආරම්භ කරනවාට වඩා අන්තර්ජාල පොත් වෙළෙඳසැලක් ආරම්භ කිරීමේ අවාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) දැනටමත් ක්‍රියාත්මක වන ජනප්‍රිය අන්තර්ජාල පොත් වෙළෙඳසැලක් **හඳුනා දක්වන්න**. (ලකුණු 02)


(d) ඔබේ මිත්‍රයා අන්තර්ජාල පොත් වෙළෙඳසැලක් විවෘත කිරීමට තීරණය කළහොත්, ඔහුට ගෙවීම් (payments) බාරගත (accept) හැක්කේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(e) ඔහුගේ අන්තර්ජාල පොත් වෙළෙඳසැල ප්‍රවර්ධනය කිරීම සඳහා, ඔහුට මුහුණු පොත (Facebook) වැනි සමාජ මාධ්‍ය අඩවි (social media sites) උපයෝගී කර ගත හැක්කේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 15)

**05 වන ප්‍රශ්නය**

පද සකසන මෘදුකාංගයක් (Word Processing Software) භාවිත කර පිළියෙල කරන ලද පත්‍රිකාවක (leaflet) පිළිබිඹුව පහතින් ප්‍රදර්ශනය කර ඇත:




1 වන පිළිබිඹුව

පහත (a) සිට (g) දක්වා සඳහන් කර ඇති ඉහත පිළිබිඹුවේ ඊතල යොදා හඳුන්වා දී ඇති එක් එක් කාර්යය සම්පූර්ණ කිරීම සඳහා ඔබ විසින් භාවිත කරනු ලබන සැකසීමේ අංගය (word processing feature) උදාහරණයේ දී ඇති ආකාරයට **පැහැදිලි කරන්න**.

මේ සඳහා ඔබ විසින් මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) මෘදුකාංගය භාවිත කරන්නේයැයි උපකල්පනය කරන්න. මෙම කාර්යය සඳහා ඔබ භාවිත කරන පරිගණකයේ දෘඪ ඩිස්කයේ (hard disk) පහත දැක්වෙන පිළිබිඹු ගොනුව (image file) (2 වන පිළිබිඹුව) (image 2) ඇති බවද උපකල්පනය කරන්න.



**2 වන පිළිබිඹුව**

අකුරු තරමේ (font size) හෝ අකුරු වර්ගයේ වෙනස්වීම් (font face changes) හෝ ඔබ සඳහන් කිරීම අවශ්‍ය නොවේ.

> **උදාහරණය:**
>
> ප්‍රශ්නය : පත්‍රිකාවේ පැති හතරෙන්ම සෙ.මී. 1 ක මායිම් තීරු (margin) තබා ගැනීමට.
>
> උත්තරය : වරණ පත (menu) භාවිත කර **Page Layout > Margins > Picture > Custom Margins** යන්න තෝරාගෙන උඩ, යට, වම සහ දකුණට සෙ.මී. 1 බැගින් මායිම් තීරු තබන්න.

(a) "Stock Clearance Sale!" යන්න පත්‍රිකාවේ දැක්වෙන ආකාරයට වක්‍රාකාර ලෙස ලබා ගැනීමට. (1 වන පිළිබිඹුවේ "a" ලකුණු කළ ඊතලයට යොමුවන්න) (ලකුණු 02)

(b) ප්‍රදර්ශනය කර ඇති පින්තූරය ලබා ගැනීමට. (1 වන පිළිබිඹුවේ "b" ලකුණු කළ ඊතලයට යොමුවන්න) සටහන: 2 වන පිළිබිඹුවේ දැක්වෙන පින්තූරය 1 වන පිළිබිඹුවේ දැක්වෙන පින්තූරය ආකාරයට සකසා ගැනීම දක්වා ඉටු කළ යුතු සියලුම කාර්යයන් ඔබ විසින් දැක්වීම අවශ්‍ය වේ. (ලකුණු 03)

(c) "All Major Brands Panasonic, Sony, LG, Philips, Samsung Sizes from 20 inch to 50 inch" යන පාඨය පත්‍රිකාවේ දැක්වෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීමට. (1 වන පිළබිඹුවේ "c" ලකුණු කළ ඊතලයට යොමුවන්න) (ලකුණු 02)

(d) "Hurry, Sale ends on 25$^{th}$ January 2016" යන පාඨය පත්‍රිකාවේ දැක්වෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීමට. (1 වන පිළිබිඹුවේ "d" ලකුණු කළ ඊතලයට යොමුවන්න) (ලකුණු 02)

(e) "Great Bargains on LCD TVs. Don't miss this once in a lifetime chance to get your hand on a brand New LCD TV" යන පාඨය කොටුවක් තුලට ගැනීමට. (text in a box) (1 වන පිළිබිඹුවේ "e" ලකුණු කළ ඊතලයට යොමුවන්න) (ලකුණු 02)

(f) "Get up to 50% off" යන පාඨයට පසුව (just after) ඊට උඩින් "$^{1}$" ඉලක්කම ලබාගෙන, එයට සම්බන්ධක පාඨයක් (a linked text) පිටුවේ පහළින් දැක්වීමට. (1 වන පිළබිඹුවේ "f" ලකුණු කළ ඊතල දෙකට යොමුවන්න) (ලකුණු 02)

(g) ප්‍රදර්ශනය කර ඇති සමාගමේ නම සහ ලිපිනය පත්‍රිකාවේ වම් අත පැත්තේ දැක්වීමට. (1 වන පිළබිඹුවේ "g" ලකුණු කළ ඊතලයට යොමුවන්න) (ලකුණු 02)

(මුළු ලකුණු 15)

## **06** වන ප්‍රශ්නය

**සේපාල පෙරේරා මහතා, සීමාසහිත ලයන් ටී (පෞද්ගලික) සමාගමේ** පද්ධති පරිපාලකවරයාය (Systems Administrator). සමාගමේ මානව සම්පත් කළමනාකරු වන **ඔමාර් හුසේන් මහතාගෙන්** පහත දැක්වෙන විද්‍යුත් තැපැල ඔහු වෙත ලැබී තිබේ:

> වෙත : සේපාල පෙරේරා (sperera@liontea.lk)
>
> ගෙන් : ඔමාර් හුසේන් (ohussain@liontea.lk)
>
> දිනය : 2016 පෙබරවාරි 05
>
> විෂය : අළුතෙන් බඳවා ගත් ලේකම්වරිය සඳහා විද්‍යුත් තැපැල් ලිපිනය
>
> හිතවත් සේපාල,
>
> කළමනාකරණ අධ්‍යක්ෂතුමාගේ ලේකම් තනතුරට ගිය සතියේ බඳවාගත් නාලනී සිල්වා මෙනෙවිය (NIC 905024500 V) සඳහා විද්‍යුත් තැපැල් ලිපිනයක් නිර්මාණය (create) කිරීමට කාරුණික වන්න. ඇය 2016 පෙබරවාරි 08 දින සේවය ආරම්භ කරනු ඇත. ඔබ විසින් විද්‍යුත් තැපැල නිර්මාණය කිරීම අවසන් කළ පසු විද්‍යුත් තැපැල් භාවිතය පිළිබඳ සමාගමේ ප්‍රතිපත්ති පිළිබඳ ඇයව දැනුවත් කිරීම සඳහා Email Rules. DOC ගොනුව අමුණා මූලික විද්‍යුත් තැපැලක් ඇය වෙත යවන්න. සිරිත් පරිදි, ඇයගේ ආරම්භක මුරපදය ලෙස ඇයගේ ජාතික හැඳුනුම්පතේ අංකය පිහිටවිය යුතුය. ආරම්භක මුරපදය වෙනස් කර ගැනීමට ඇයට මඟ පෙන්වීම සඳහා මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) ලියවිල්ලක් ද කරුණාකර අමුණා යවන්න.
>
> කරුණාකර යවනු ලබන විද්‍යුත් තැපැල මට සහ කළමනාකරණ අධ්‍යක්ෂතුමාට පිටපත් කරන්න.
>
> සුබ පැතුම්,<br>ඔමාර්.

**සීමාසහිත ලයන් ටී (පෞද්ගලික) සමාගමේ** විද්‍යුත් තැපැල් ලිපිනයන් සඳහා වන සමාගම් ප්‍රතිපත්තිය වන්නේ සියලුම සේවකයන් සඳහා පරිශීලක නාමය (username) ලෙස, ඔවුන්ගේ පළමු නමේ (first name) ප්‍රථම අක්ෂරය පෙළපත් නාමය ද (surname) සමග සිටින ආකාරයෙන් යොදා විද්‍යුත් තැපැල් ලිපින නිර්මාණය කිරීම ය. තවද, සේවකයෙකු විසින් සේවය ආරම්භ කරන විට මානව සම්පත් කළමනාකරු විසින් විද්‍යුත් තැපැල් ලිපිනයක් සහ ආරම්භක මුර පදයක් සපයනු ලැබේ.

**සේපාල පෙරේරා මහතාගේ** කාර්යභාරය ඉටුකිරීමට ඔබට සිදුවී ඇතැයි ද ඔබ විසින් නූතන විද්‍යුත් තැපැල් මෘදුකාංග භාවිත කරන බව ද උපකල්පනය කරන්න.

තවද, පහත දැක්වෙන තොරතුරු ද ඔබට සපයා ඇත:

- **සීමාසහිත ලයන් ටී (පෞද්ගලික) සමාගමේ** ලිපිනය:

  අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව. දුරකතන: +94-11-2559900
- **සීමාසහිත ලයන් ටී (පෞද්ගලික) සමාගමේ** කළමනාකරණ අධ්‍යක්ෂ : රවී මුරලිදරන් මහතාය.
- සේපාල පෙරේරා මහතාගේ නිල දුරකතන අංකය : +94-11-2559900 දිගු අංකය 1234.
- සේපාල පෙරේරා මහතාගේ ජංගම දුරකතන අංකය : +94-77-1231000.

(a) විද්‍යුත් තැපැල් යැවීම සම්බන්ධයෙන් ඔබගේ දැනුම භාවිත කර ඉහත තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා, අංක (1) සිට (8) දක්වා ලකුණු කළ කොටු සඳහා යෝග්‍ය පාඨ **හඳුනා දක්වන්න**.

ඔබේ උත්තරය, පොතේ, එක් එක් කොටු අංකය සමග, ලියන්න. යම්කිසි කොටුවක් හිස්ව තැබිය යුතුයැයි ඔබ සිතන්නේනම්, එම කොටු අංකය කිසිවක් නොලියා හිස්ව තබන්න.

| | |
|---|---|
| වෙත (To) | ----------------------(1)-------------------------- |
| CC | -----------------------(2)-------------------------- |
| BCC | -----------------------(3)-------------------------- |
| විෂය (Subject) | -----------------------(4)-------------------------- |

ප්‍රිය -------------------------(5)-------------------------

**සීමාසහිත ලයන් වී (පෞද්ගලික) සමාගමේ** තොරතුරු තාක්ෂණ (IT) දෙපාර්තමේන්තුව වෙනුවෙන් මම ඔබ සාදරයෙන් පිළිගනිමි!

අපේ සමාගම පිළිබඳව ඔබ වඩාත් දැනුවත් වන විට, එය වැඩ කිරීමට පොළඹවන අභිදක්ෂයන් බොහෝදෙනෙකු සිටින බහුවිධ අවස්ථා සපිරි උද්දීපිත (exciting) ස්ථානයක් ලෙස හඳුනාගනු ඇත. ඔබ අපේ කණ්ඩායමේ අවශ්‍යම කොටසක් වනු ඇතැයි අප දන්නා අතර, අප සමාගමෙන් ඔබ වෙත දායාද කෙරෙන සියලුම දෙයින්, වාසි අත්කරගනු ඇතැයි ද විශ්වාස කරමු.

සමාගමේ දැනට ක්‍රියාත්මක වන විද්‍යුත් තැපැල් වලට අදාල ප්‍රතිපත්ති විස්තර කෙරෙන ලියවිල්ල මෙයට අමුණා එවා ඇත. අවශ්‍ය කාලය මිඩංගු කර එය කියවා බලන්න. තවද, ඔබගේ ආරම්භක මුරපදය වෙනස් කළ හැක්කේ කෙසේදැයි උපදෙස් දෙන ලියවිල්ලක් ද වෙනම අමුණා එවා ඇත.

ඔබට පැහැදිලි කරගත යුතු කිසිවක් වේ නම්, නොපැකිලව මා අමතන්න.

හිතවත්

--------------------------(6)----------------------------------

| | |
|---|---|
| අත්සන පාඨ (Signature Text) | ----------------------(7)-------------------------- |
| ඇමුණුම් | -------------------------(8)------------------------ |

(ලකුණු 09)

(b) එක් එක් වර්ගයට උදාහරණ දෙක(02) බැගින් දෙමින් වෙබ් පාදක විද්‍යුත් තැපැල් ග්‍රාහකයින් (web-based email clients) සහ තනි විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් (standalone email clients) අතර වෙනස **පැහැදිලි කරන්න**.

(ලකුණු 06)
(මුළු ලකුණු 15)

## 07 වන ප්‍රශ්නය

**එකෝ-මිල්ක්,** කිරි ආහාර විකිණීමේ යෙදෙන වෙළෙඳසැලක් ලෙස, ළඟදී විවෘත කිරීමට නියමිතය. එහි නිෂ්පාදිත ලැයිස්තුවෙන් උපුටා ගැනීමක් පහත ප්‍රදර්ශනය කර ඇත. නිෂ්පාදිත ලැයිස්තුව පරිගණකගත දත්ත පදනමක ගබඩා කර තැබීමට වෙළෙඳසැල සැලසුම් කරමින් සිටී:

| **නිෂ්පාදිත වර්ගය** | **නිෂ්පාදිතයේ නම** | **සැපයුම්කරු** | **බර (ග්‍රෑම්)** | **විශ්ව නිෂ්පාදිත කේතය (Universal Product Code)** | **කල් ඉකුත් වන දිනය** | **විකුණුම් මිල (රු.)** | **කාඩ්පත් දරන්නන්ට 5% වට්ටම** |
|---|---|---|---|---|---|---|---|
| කිරි | රත්කර් | සීමාසහිත ඩේරිකෝ සමාගම | 1,000 | 123456789012 | 2016.07.11 | 810.00 | ඔව් |
| කිරි | ඩෙල්මෝ | සීමාසහිත ඩේරිකෝ සමාගම | 400 | 123456789013 | 2016.01.26 | 325.00 | ඔව් |
| කිරි | නිව් ඩෙලා | සීමාසහිත ඩේරි ෆූඩ්ස් | 400 | 623455789119 | 2016.05.11 | 310.00 | නැත |
| බටර් | රත්කර් | සීමාසහිත ඩේරිකෝ සමාගම | 227 | 123456783321 | 2016.04.12 | 495.00 | ඔව් |
| බටර් | නිව් ඩෙලා | සීමාසහිත ඩේරි ෆූඩ්ස් | 200 | 123456781201 | 2016.06.11 | 290.00 | නැත |
| චීස් | හැපි ක්‍රාෆ්ට් | සීමාසහිත ටැසන්ස් | 340 | 123456723233 | 2016.03.09 | 639.00 | ඔව් |
| යෝගට් | නිව් ඩෙලා | සීමාසහිත ඩේරි ෆූඩ්ස් | 500 | 123452345563 | 2016.01.31 | 150.00 | ඔව් |
| චීස් | චීඩෝ | සීමාසහිත ටැසන්ස් | 250 | 123456782222 | 2016.03.16 | 945.00 | ඔව් |

ඉහත දී ඇති තොරතුරු පමණක් තිබේයැයි සලකමින් පහත ප්‍රශ්නවලට උත්තර සපයන්න:

(a) ඉහත දී ඇති ක්ෂේත්‍ර අතුරෙන් ප්‍රධාන ක්ෂේත්‍රය (key field) ලෙස සලකා බැලීමට වඩාත්ම සුදුසු ක්ෂේත්‍රය **තෝරන්න**. ඔබගේ තෝරා ගැනීමට පාදක වන හේතුව **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(b) පහත සඳහන් එක් එක් ක්ෂේත්‍රය සඳහා වඩාත්ම සුදුසු දත්ත වර්ගය **හඳුනා දක්වන්න**:

| **ක්ෂේත්‍රයේ නම** | **දත්ත වර්ගය** |
|---|---|
| නිෂ්පාදිත වර්ගය | |
| නිෂ්පාදිතයේ නම | |
| සැපයුම්කරු | |
| බර | |
| විශ්ව නිෂ්පාදිත කේතය | |
| කල් ඉකුත් වන දිනය | |
| විකුණුම් මිල | |
| කාඩ්පත් දරන්නන්ට 5% වට්ටම් | |

(ලකුණු 08)

(c) විකුණන ලද අයිතම අතර නිෂ්පාදිත වර්ග හතරක් පමණක් ඇතැයි උපකල්පනය කරමින්, දත්ත ඇතුළු කිරීමේ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කිරීම සඳහා වගුවේ ව්‍යුහයට (table structure) කළහැකි යම් වෙනස්කම් **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(d) විකුණන ලද නිෂ්පාදිතයක උපරිම බර ග්‍රෑම් 5,000 ක් සහ අවම බර ග්‍රෑම් 100 ක් යැයි උපකල්පනය කරමින්, දත්ත ඇතුළුකිරීමේ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කිරීම සඳහා වගුවේ ව්‍යුහයට කළ හැකි වෙනස්කම් **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 15)

*B කොටසෙහි අවසානය*